# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 මාර්තු මස 28 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2025.03.28 දින නිකුත් කරන ලදී)**

**අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)**

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 84.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය:* මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට 144අ වන සහ 144ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් එම පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ -

(අ) එම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ යම් සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම සඳහා මහෙස්ත්‍රාත්වරයාට බලය ලබා දීම පිණිස; සහ

(ආ) මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් සැකකරුවකු හෝ චූදිතයකු අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත් නොහැරිය යුතු වනුයේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද එම අවස්ථානුගත කරුණු නිශ්චිතව දැක්වීම පිණිස,

විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*4 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 241අ වන සහ 241ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ -

(අ) එම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ යම් චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම සඳහා මහාධිකරණයේ විනිශ්චයකාරවරයාට බලය ලබා දීම පිණිස; සහ

(ආ) මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් යම් චූදිතයකු අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්නොහැරිය යුතු වනුයේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද එම අවස්ථානුගත කරුණු නිශ්චිතව දැක්වීම පිණිස,

විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 273අ සිට 273ද දක්වා වන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ -

(අ) අධිකරණයේ යම් විමර්ශනයක් හෝ නඩු විභාගයක් සිදුවෙමින් පවතින කාලය තුළ දී සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධකයක් මගින් යම් සාක්ෂිකරුවකුගේ දූරස්ථ සාක්ෂි විභාග කිරීම වාර්තාගත කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයා වෙත බලය ලබා දීම පිණිස;

(ආ) වාර්තා ඉදිරිපත් කිරීම සඳහා සහ අධිකරණයේ පෙනී සිටීම සඳහා රාජ්‍ය අංශයේ විශේෂඥයන් වෙත සිතාසි නිකුත් කරන ලෙස උචිත අවස්ථාවල දී අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයා වෙත බලය ලබා දීම පිණිස;

(ඇ) එම විශේෂඥයන් විසින් ස්වකීය අත්සන් තබන ලද වාර්තා අධිකරණය වෙත ඉලෙක්ට්‍රොනිකව සම්ප්‍රේෂණය කිරීමට හැකි කරවීම පිණිස; සහ

(ඈ) අධිකරණය වෙත ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලැබී ඇති විශේෂඥ වාර්තාව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගැනීම පිණිස,

විධිවිධාන සැලැස්වීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට 24 වන සහ 25 වන අලුත් ආකෘතිපත්‍ර ඇතුළත් කිරීම මගින් එම ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.-ඔ 5/2018

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක      දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතට 144අ සහ 144ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 144 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 144අ සහ 144ආ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:–

"විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරිය හැකි බව

**144අ.** (1) මහෙස්ත්‍රාත්වරයා විසින්, මේ වගන්තියේ (4) වන උපවගන්තියේ සහ 144ආ වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, එකී මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ අපරාධ නඩුවක් පවරනු ලැබ ඇත්තේ යම් සැකකරුවකු හෝ චූදිතයකු සම්බන්ධයෙන් ද, එකී සැකකරුට හෝ චූදිතයාට පහත දැක්වෙන හේතු සඳහා අධිකරණය ඉදිරියේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හරිනු ලැබිය හැකි ය:-

(අ) රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා;

(ආ) ඇප ඉල්ලීමක් විභාග කිරීම සඳහා;

(ඇ) යම් විමර්ශනයක්, යම් අපරාධ නඩු

2-PL15081 -465(2025/01)

විභාගයක්, යම් පරීක්ෂණයක් හෝ වෙනත් යම් නඩු කටයුත්තක් පැවැත්වීම සඳහා සහාය වීම පිණිස කරනු ලබන ඉල්ලීමක් විභාග කිරීම සඳහා; හෝ

(ඇ) වෙනත් යම් කාර්යයක් සඳහා.

(2) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතු එකක් හෝ වැඩි ප්‍රමාණයක් මත යම් සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලැබිය හැකි බවට මහෙස්ත්‍රාත්වරයා විසින් සෑහීමකට පත් වන්නේ නම්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ තැනැත්තා විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, එකී සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම එසේ අත්හරිනු ලැබිය හැකි ය.

(3) යම් සැකකරුවකු හෝ චූදිතයකු සම්බන්ධයෙන් (2) වන වගන්තිය යටතේ වන ඉල්ලීමක්-

(අ) නීතිපතිවරයා විසින්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, සැකකරු හෝ චූදිතයා විසින් ම හෝ ඔහුගේ නීතිඥවරයා විසින්;

(ඇ) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්;

(ඈ) සැකකරු හෝ චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින්; හෝ

(ඉ) සැකකරු හෝ චූදිතයා රඳවා ඇති ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින්,

සිදු කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හැරීම, පහත දැක්වෙන හේතු මත සිදු කරනු ලැබිය හැකිය:–

(අ) සැකකරුගේ හෝ චූදිතයාගේ ජීවිතයට තර්ජනයක් හෝ බරපතළ හානියක් පිළිබඳ සැකයක් පවතින අවස්ථාවක දී;

(ආ) සැකකරු හෝ චූදිතයා විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරද පිළිබඳ මහජනතාව විසින් දක්වනු ලබන ප්‍රතික්‍රියාව හේතුවෙන් සාමය කඩවීමක් සිදු වීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඇ) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ගැනීමෙන් පලා යාමට හෝ ස්වේච්ඡාවෙන් නොවන ආකාරයට රඳවා ගැනීමෙන් ඉවත් කරනු ලැබීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඈ) සැකකරු හෝ චූදිතයා විසින් අධිකරණයේ නඩු කටයුතුවලට බාධා කිරීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඉ) ජීවිතයට අන්තරායදායක වන යම් බෝවන හෝ සංස්පර්ශක රෝගයක් ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා සැකකරු හෝ චූදිතයා යම් ලිඛිත නීතියක් යටතේ නිරෝධායන තත්ත්වයකට යටත් කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඊ) යම් ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාරව අනිවාර්යය පුනරුත්ථාපනයට ඇතුළත්

කරනු ලැබ ඇති යම් සැකකරුවකු හෝ චූදිතයකු පෞද්ගලිකව ම පෙනී සිටීම එකී සැකකරුගේ හෝ චූදිතයාගේ පුනරුත්ථාපන ක්‍රියාවලියට බාධාවක් වන අවස්ථාවක දී සහ එම සැකකරුගේ හෝ චූදිතයාගේ පෙනී සිටීමේ අරමුණ රඳවා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා වන අවස්ථාවක දී; හෝ

(උ) තත්කාලයේ පවතින වසංගතයක් හෝ වෙනත් ඒ හා සමාන තත්ත්වයක් හේතුවෙන් සැකකරුගේ හෝ චූදිතයාගේ පෞද්ගලිකව ම පෙනී සිටීම මහජනතාවගේ ආරක්ෂාවට සහ සෞඛ්‍යයට තර්ජනයක් ඇති වීමට ඉඩ ඇති අවස්ථාවක දී:

එසේ වුව ද, මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක පැවැත්ම නතර වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක දී, එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටිය යුතු යැයි විධාන කිරීම ද ඔහුගේ පෙනී සිටීම මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකි ය.

(5) යම් මහෙස්ත්‍රාත්වරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලබන අවස්ථාවක දී, එසේ කිරීමට හේතු ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු අතර, එකී සැකකරුට හෝ චූදිතයාට -

(අ) නීතිඥවරයකු මගින් අධිකරණයේ දී නියෝජනය වීමට අයිතිය තිබිය යුතු ය; සහ

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ස්වකීය නියෝජනය සිදු කිරීමට සහ එකී සැකකරුට හෝ චූදිතයාට ඔහු විසින්, ඔහු වෙනුවෙන් හෝ ඔහු සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති නඩු කටයුතු එවැනි සම්බන්ධයක් හරහා නිරීක්ෂණය කිරීමට අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

(6) (අ) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව සැකකරුට හෝ චූදිතයාට ස්වකීය නියෝජනය සිදු කිරීම සඳහා සහ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීමට අධිකරණය තුළ අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) එකී සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානයේ ස්ථානය භාර නිලධරයා විසින් හෝ එකී තැනැත්තා රඳවා තබා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින් මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විමසා, (අ) ඡේදයේ සඳහන් කර ඇති පරිදි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ස්වකීය නියෝජනය සිදු කිරීම සඳහා සහ අධිකරණයේ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා, රඳවා තබා ගන්නා ලද එකී සැකකරුට හෝ චූදිතයාට අවශ්‍ය පහසුකම් සලස්වනු ලැබිය යුතු ය.

(7) එකී සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය, එකී සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට

නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ කොට්ඨාසය තුළ පිහිටනු ලබන අවස්ථාවක දී, එකී මහෙස්ත්‍රාත්වරයා විසින් නඩුව කැඳවා පැය හතළිස්අටක් ගත වීමට පෙර එම රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට යා යුතු අතර, එසේ රඳවා තබා ඇති සැකකරුගේ හෝ චූදිතයාගේ යහපැවැත්ම පිළිබඳ සොයා බැලිය යුතු ය.

(8) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය, එකී සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ කොට්ඨාසයෙන් පිටත පිහිටනු ලබන අවස්ථාවක දී, (7) වන උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට යන ලෙස නියමිත ආකෘති පත්‍රය මගින්, අදාළ අධිකරණ කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම දැනුම් දී ඉල්ලා සිටීම එකී මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(9) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පිහිටා ඇත්තේ කවර මහෙස්ත්‍රාත්වරයකුට අයත් අධිකරණ කොට්ඨාසයක් තුළ ද, එකී මහෙස්ත්‍රාත්වරයාට එම රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට යාමට නොහැකි වන අවස්ථාවක දී, (7) වන උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා, නියමිත ආකෘති පත්‍රය මගින්, වෙනත් යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත වහාම දැනුම් දී සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කර බලන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටීම එකී මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(10) (8) වන හෝ (9) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුට ද, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, එම සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට යන ලෙස ඉල්ලා සිටින ආකෘතිපත්‍රය ඔහු වෙත ලැබීමෙන් පැය හතළිස්අටක් ගත වීමට පෙර එකී ස්ථානය පරීක්ෂා කිරීමට යා යුතු අතර, එකී පරීක්ෂා කිරීමට යෑමෙන් සතියක් ඇතුළත, සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාට, තත්කාර්ය සඳහා නියමිත ආකෘති පත්‍රයෙන් එකී පරීක්ෂා කිරීම පිළිබඳව ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

(11) එසේ රඳවා තබා ඇති යම් සැකකරුවකු හෝ චූදිතයකු, (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එකී රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට පැමිණෙන මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම සහ එකී මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන පහසුකම් ඔහු වෙත සැලැස්වීම එම රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයාගේ හෝ බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යය විය යුතු ය.

(12) (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව, යම් සැකකරුවකුගේ හෝ චූදිතයකුගේ යහපැවැත්ම පිළිබඳ සොයා බැලීමට රඳවා තබා ඇති ස්ථානය වෙත හෝ බන්ධනාගාරය වෙත යම් මහෙස්ත්‍රාත්වරයකු පැමිණෙන අවස්ථාවක දී, එකී සැකකරු හෝ චූදිතයා නියෝජනය කරනු ලබන නීතිඥවරයකුට එම අවස්ථාවේ දී පැමිණීමට අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

සැකකරුවකුට හෝ චූදිතයකුට පෞද්ගලිකවම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු නොලැබිය යුතු අවස්ථානුගත කරුණු

**144ආ.** (1) මහෙස්ත්‍රාත්වරයා විසින්, පහත දැක්වෙන අවස්ථාවල දී 144අ වන වගන්තිය යටතේ සැකකරුවකු හෝ චූදිතයකු අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හැරීම සිදු නොකරනු ලැබිය යුතු ය:-

(අ) යම් සැකකරුවකු හෝ චූදිතයකු පොලිස් නිලධරයකු, රේගු නිලධරයකු, සුරාබදු නිලධරයකු හෝ වන නිලධරයකු භාරයෙන් හෝ රඳවා තබා ඇති ස්ථානයෙන් මහෙස්ත්‍රාත්වරයකු වෙත පළමුවරට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී සහ එකී පෞද්ගලිකවම පෙනී සිටීම අදාළ නීතියේ විධිවිධාන ප්‍රකාරව අනිවාර්යය වන අවස්ථාවක දී;

(ආ) රඳවා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරන ලද යම් සැකකරුවකු හෝ චූදිතයකු විසින්, රඳවා තබා ඇති ස්ථානයේ හෝ බන්ධනාගාරයේ රඳවා සිටිය දී තමා පහර දීමට, වධ දීමට හෝ මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් යටතට වැටෙන වෙනත් යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ලක් වූ බවට හෝ පහර දෙන බවට, වධ දෙන බවට හෝ මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් යටතට වැටෙන වෙනත් යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ලක් කරන බවට තර්ජනය කිරීමට ලක් වූ බවට පැමිණිල්ලක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඇ) යම් සැකකරුවකු හෝ චූදිතයකු සිහිවිකල තැනැත්තකු වන අවස්ථාවක දී;

(ඇ) සැකකරු හෝ චූදිතයා අධිකරණයේ පෞද්ගලිකවම පෙනී සිටීම නඩුවේ අවස්ථානුගත කරුණු සඳහා හෝ යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය බවට මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක දී හෝ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් පිළිබඳව මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී;

(ඉ) චෝදනා පත්‍රය හෝ තීන්දුව ලබා ගැනීම සඳහා නීතිඥයකු තමා නියෝජනය කිරීම වෙනුවෙන් චූදිතයා විසින් කැමැත්ත පළ කරනු නොලබන අවස්ථාවක දී:

එසේ වුව ද, චෝදනා පත්‍රය හෝ තීන්දුව ලබා ගැනීම සඳහා නීතිඥවරයකු තමා නියෝජනය කිරීම වෙනුවෙන් චූදිතයා කැමැත්ත පළ කරනු ලබන්නේ නම්, චූදිතයා රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයා හරහා හෝ බන්ධනාගාර අධිකාරිවරයා හරහා ඔහු වෙත පිටපතක් භාරදීම සඳහා ආඥාවක් කරනු ලැබීම සහ චූදිතයා වෙත එකී පිටපත භාරදුන් බව තහවුරු කිරීමෙන් පසු එකී කරුණු පිළිබඳ වාර්තාගත කර තබා ගැනීම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(2) 192 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහෙස්ත්‍රාත්වරයා විසින්, නඩු විභාගයේ දී තමාව නියෝජනය කිරීම සඳහා චූදිතයා විසින් යම් නීතිඥවරයකුට කැමැත්ත ලබා දී ඇත්නම් සහ එකී නීතිඥවරයාට සහ චූදිතයාට අධිකරණයේ දී, චූදිතයා රඳවා තබා ඇති ස්ථානයේ දී සහ බන්ධනාගාරයේ දී පෞද්ගලිකව සන්නිවේදනය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දී ඇත්නම් මිස, එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු නොලැබිය යුතු ය.

(3) 192 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහෙස්ත්‍රාත්වරයා විසින්, චූදිතයාගේ හෝ ඔහුගේ නීතිඥවරයාගේ ප්‍රකාශිත කැමැත්තෙන් තොරව නඩු විභාගය ආරම්භ කිරීමෙන් පසුව එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ “අධිචෝදනා පත්‍රය ඔහුට භාරදීමට නොහැකි වී ඇති බවට” යන වචන වෙනුවට “අධිචෝදනා පත්‍රය ඔහුට භාරදීමට නොහැකි වී ඇති බවට; හෝ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

“(ඇ) 241අ වන සහ 241ආ වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගෙන, එකී තැනැත්තාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හැරිය යුතු බවට,”.

ප්‍රධාන ප්‍රඥප්තියට 241අ සහ 241ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 241අ වන සහ 241ආ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

“විශේෂ අවස්ථානුගත කරුණු යටතේ චූදිතයාට පෞද්ගලිකවම පෙනී සිටීමට නියම කිරීම අත්හැරිය හැකි බව

**241අ.** (1) අදාළ අධිකරණ කලාපයේ මහාධිකරණයේ සැසි වාරයන්හි මූලාසනය දරනු ලබන මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින්, මේ වගන්තියේ (4) වන උපවගන්තියේ සහ 241ආ වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ජූරි සභාවක් සහිතව හෝ ජූරි සභාවක්

රහිතව මහාධිකරණයේ නඩු විභාගයක් ආරම්භ කිරීමට නියමිතව ඇත්තේ හෝ ආරම්භ කරනු ලැබ ඇත්තේ යම් චූදිතයකු සම්බන්ධයෙන් ද, එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලැබිය හැකි ය.

(2) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු එකක් හෝ වැඩි ප්‍රමාණයක් මත යම් චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලැබිය හැකි බවට විනිශ්චයකාරවරයා විසින් සෑහීමකට පත් වන්නේ නම්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ තැනැත්තා විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, එකී චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම එසේ අත්හරිනු ලැබිය හැකි ය.

(3) යම් චූදිතයකු සම්බන්ධයෙන්, (2) වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක්-

(අ) නීතිපතිවරයා විසින්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, චූදිතයා විසින් ම හෝ ඔහුගේ නීතිඥවරයා විසින්;

(ඇ) චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින්; හෝ

(ඈ) රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයා විසින්,

සිදු කරනු ලැබිය යුතු ය.

(4) විනිශ්චයකාරවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හැරීම, පහත දැක්වෙන හේතු මත සිදුකරනු ලැබිය හැකි ය:-

(අ) චූදිතයාගේ ජීවිතයට තර්ජනයක් හෝ බරපතළ හානියක් පිළිබඳ තර්ජනයක් පවතින අවස්ථාවක දී;

(ආ) චූදිතයා විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරද පිළිබඳ මහජනතාව විසින් දක්වනු ලබන ප්‍රතික්‍රියාව හේතුවෙන් සාමය කඩ වීමක් සිදු වීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඇ) චූදිතයා රඳවා තබා ගැනීමෙන් පලා යාමට හෝ ස්වේච්ඡාවෙන් නොවන ආකාරයට රඳවා ගැනීමෙන් ඉවත් කරනු ලැබීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඈ) චූදිතයා විසින් අධිකරණයේ නඩු කටයුතුවලට බාධා කිරීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඉ) ජීවිතයට අන්තරායදායක වන යම් බෝවන හෝ සංස්පර්ශක රෝගයක් ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා චූදිතයා යම් ලිඛිත නීතියක් යටතේ නිරෝධායන තත්ත්වයකට යටත් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ඊ) තත්කාලයේ පවතින වසංගතයක් හෝ වෙනත් ඒ හා සමාන තත්ත්වයක් හේතුවෙන් චූදිතයා පෞද්ගලිකව ම පෙනී සිටීම මහජනතාවගේ ආරක්ෂාවට සහ සෞඛ්‍යයට තර්ජනයක් ඇති වීමට ඉඩ ඇති අවස්ථාවක දී:

එසේ වුව ද, මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක පැවැත්ම නතර වී ඇති බව විනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී, එකී විනිශ්චයකාරවරයා විසින්, චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටිය යුතු යැයි විධාන කිරීම ද, ඔහුගේ පෙනී සිටීම මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකි ය.

(5) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලබන අවස්ථාවක දී, එසේ කිරීමට හේතු ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු අතර, එකී චූදිතයා-

(අ) නීතිඥවරයකු මගින් අධිකරණයේ දී නියෝජනය විය යුතු ය; සහ

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ස්වකීය නියෝජනය සිදු කිරීමට සහ එකී චූදිතයාට ඔහු විසින්, ඔහු වෙනුවෙන් හෝ ඔහු සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති නඩු කටයුතු එවැනි සම්බන්ධකයක් හරහා නිරීක්ෂණය කිරීමට අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

(6) (අ) මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, චූදිතයාට ස්වකීය නියෝජනය සිදු කිරීම සඳහා සහ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීමට අධිකරණය තුළ අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) එකී චූදිතයා රඳවා තබා ඇති ස්ථානයේ ස්ථානය භාර නිලධරයා විසින් හෝ චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින් මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විමසා, (අ) ඡේදයේ සඳහන් කර ඇති පරිදි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ස්වකීය නියෝජනය සිදු කිරීමට සහ අධිකරණයේ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා රඳවා තබා ගන්නා ලද එකී චූදිතයාට අවශ්‍ය පහසුකම් සලස්වනු ලැබිය යුතු ය.

(7) එකී චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය, එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද විනිශ්චයකාරවරයාගේ අධිකරණ කොට්ඨාසය තුළ පිහිටනු ලබන අවස්ථාවක දී, නියමිත ආකෘති පත්‍රය මගින්, අදාළ අධිකරණ කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම දැනුම් දී නඩුව කැඳවා පැය හතළිස්අටක් ගත වීමට පෙර චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කර චූදිතයාගේ යහපැවැත්ම පිළිබඳ සොයා බලන ලෙස ඉල්ලා සිටීම එකී විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(8) චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය, එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද විනිශ්චයකාරවරයාගේ අධිකරණ කලාපයෙන් පිටත පිහිටනු ලබන අවස්ථාවක දී, නියමිත ආකෘති පත්‍රය මගින්, අදාළ අධිකරණ කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම දැනුම් දී නඩුව කැඳවා පැය හතළිස්අටක් ගත වීමට පෙර (7) වන වගන්තියේ සඳහන් කාර්යය සඳහා, චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කර බලන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටීම එකී විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(9) චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත්වරයකුට අයත් අධිකරණ කලාපයක් තුළ ද, එකී මහෙස්ත්‍රාත්වරයාට චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට යාමට නොහැකි වන අවස්ථාවක දී, නියමිත ආකෘති පත්‍රය මගින්, වෙනත් යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත වහාම දැනුම් දී (7) වන උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා, රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කර බලන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටීම එකී මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(10) (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තිය යටතේ දැනුම් දෙනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, චූදිතයා රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කරන ලෙස ඉල්ලා සිටිනු ලබන ආකෘති පත්‍රය ඔහු වෙත ලැබීමෙන් පැය හතළිස්අටක් ගත වීමට පෙර එකී ස්ථානය පරීක්ෂා කර බැලීමට යා යුතු අතර, එකී පරීක්ෂා කිරීමෙන් සතියක් ඇතුළත චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද විනිශ්චයකාරවරයා වෙත තත්කාර්යය සඳහා නියමිත ආකෘති පත්‍රයෙන් එකී පරීක්ෂා කිරීම පිළිබඳව ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

(11) එසේ රඳවා ඇති යම් චූදිතයකු, (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එකී රඳවා තබා ඇති ස්ථානය හෝ බන්ධනාගාරය පරීක්ෂා කිරීමට පැමිණෙන මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම සහ එකී මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන පහසුකම් ඔහු වෙත සැලැස්වීම එකී චූදිතයා රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයාගේ හෝ බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යය විය යුතු ය.

(12) (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව, යම් චූදිතයකුගේ යහපැවැත්ම පිළිබඳව සොයා බැලීමට ඒ තැනැත්තා රඳවා තබා ඇති ස්ථානයට හෝ බන්ධනාගාරයට යම් මහෙස්ත්‍රාත්වරයකු පැමිණෙන අවස්ථාවක දී, එකී චූදිතයා නියෝජනය කරනු ලබන යම් නීතිඥවරයකුට එම අවස්ථාවේ දී පැමිණීමට අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

සැකකරුවකුට පෞද්ගලිකවම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු නොලැබිය යුතු අවස්ථානුගත කරුණු

**241ආ.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් පහත දැක්වෙන අවස්ථාවල දී 241අ වන වගන්තිය යටතේ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හැරීම සිදු නොකරනු ලැබිය යුතු ය:-

(අ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු වෙත ඉදිරිපත් කරන ලද යම් චූදිතයකු විසින්, සිරභාරයේ දී හෝ රඳවා තබා ඇති ස්ථානයේ රඳවා සිටිය දී තමා පහර දීමට, වධ දීමට හෝ මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් යටතට වැටෙන වෙනත් යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ලක් වූ බවට හෝ පහර දෙන බවට, වධ දෙන බවට හෝ මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් යටතට වැටෙන වෙනත් යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ලක් කරන බවට තර්ජනය කිරීමට ලක් වූ බවට පැමිණිල්ලක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ආ) එකී චූදිතයා සිහිවිකල් වූ තැනැත්තකු වන අවස්ථාවක දී;

(ඇ) චූදිතයා අධිකරණයේ පෞද්ගලිකවම පෙනී සිටීම, නඩුවේ අවස්ථානුගත කරුණු සඳහා හෝ යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය බවට විනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී හෝ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් පිළිබඳව විනිශ්චයකාරවරයා විසින්, සෑහීමකට පත් වන අවස්ථාවක දී;

(ඇ) අධිචෝදනා පත්‍රය හෝ තීන්දුව ලබා ගැනීම සඳහා නීතිඥයකු තමා නියෝජනය කිරීම වෙනුවෙන් චූදිතයා විසින් කැමැත්ත පළ කරනු නොලබන අවස්ථාවක දී:

එසේ වුව ද, අධිචෝදනා පත්‍රය හෝ තීන්දුව ලබා ගැනීම සඳහා නීතිඥවරයකු තමා නියෝජනය කිරීම වෙනුවෙන් චූදිතයා විසින් කැමැත්ත පළ කරනු ලබන්නේ නම්, චූදිතයා රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයා හරහා හෝ බන්ධනාගාරයේ අධිකාරිවරයා

හරහා ඔහු වෙත පිටපතක් භාර දීම සඳහා ආඥාවක් කරනු ලැබීම සහ චූදිතයා වෙත එකී පිටපත භාර දුන් බව තහවුරු කිරීමෙන් පසු එකී කරුණු පිළිබඳ වාර්තාගත කර තබා ගැනීම මහාධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(2) 241 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, නඩු විභාගයේ දී තමාව නියෝජනය කිරීම සඳහා චූදිතයා විසින් යම් නීතිඥවරයකුට කැමැත්ත ලබා දී ඇත්නම් සහ එකී නීතිඥවරයාට සහ චූදිතයාට අධිකරණයේ දී, චූදිතයා රඳවා තබා ඇති ස්ථානයේ දී සහ බන්ධනාගාරයේදී පෞද්ගලිකව සන්නිවේදනය සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දී ඇත්නම් මිස, එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු නොලැබිය යුතු ය.

(3) 241 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, චූදිතයාගේ හෝ ඔහුගේ නීතිඥවරයාගේ ප්‍රකාශිත කැමැත්තකින් තොරව නඩු විභාගය ආරම්භ කිරීමෙන් පසුව එකී චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 273අ, 273ආ, 273ඇ, 273ඈ, 273ඉ, 273ඊ, 273උ, 273ඌ, 273එ, 273ඒ, 273ඔ, 273ඕ, 273ක, 273ග, 273ච, 273ජ, 273ට, 273ඩ, 273ණ, 273ත සහ 273ද යන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 273 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 273අ, 273ආ, 273ඇ, 273ඈ, 273ඉ, 273ඊ, 273උ, 273ඌ, 273එ, 273ඒ, 273ඔ, 273ඕ, 273ක, 273ග, 273ච, 273ජ, 273ට, 273ඩ, 273ණ, 273ත සහ 273ද යන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:–

“නඩු විභාගය හෝ පරීක්ෂණයක් අතරතුර සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම

**273අ.** (1) 272 වන සහ 273 වන වගන්තිවල විධිවිධානවල සහ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, -

(අ) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි, අදාළ තැනැත්තා විසින් සිදු කරන ලද ඉල්ලීමක් මත; හෝ

(ආ) යුක්තිය පසිඳලීම සඳහා ස්වකීය මෙහෙයවීමෙන්ම,

(3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් දුරස්ථ ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබා දීම සිදු කළ හැකි බවට විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් -

(අ) නීතිපතිවරයා විසින්;

(ආ) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්;

(ඇ) 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ අර්ථානුකූලව අපරාධයක සාක්ෂිකරුවකු හෝ වින්දිතයකු නියෝජනය කරනු ලබන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය විසින්;

(ඈ) රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයා විසින්; හෝ

(ඉ) අවස්ථාවෝචිත පරිදි, චූදිතයා විසින් ම හෝ ඔහුගේ නීතිඥවරයා විසින්,

සිදු කරනු ලැබිය හැකි ය.

(3) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් විධානයක් නිකුත් කිරීමට පෙර, අවස්ථාවෝචිත පරිදි, චෝදක පක්ෂයේ, විත්ති පක්ෂයේ හෝ සාක්ෂිකරුගේ යම් කරුණු දැක්වීම් හෝ විරෝධතා පිළිබඳ සලකා බැලිය යුතු ය.

(4) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, -

(අ) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ඉල්ලීම පිළිබඳ දැන්වීම සියලු පාර්ශ්ව වෙත ලැබී ඇති බවට;

(ආ) පහත සඳහන් පරිදි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය සහ වෙනත් යම් පහසුකම් පවතින බවට හෝ ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට සැලැස්විය හැකි බවට:-

(i) අධිකරණය තුළ සිටින තැනැත්තන්ට, සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයේ සිට නඩු කටයුතුවලට සහභාගී වන වෙනත් සියලු තැනැත්තන් දැකීමට සහ ඔවුන්ට ඇහුම්කන් දීමට හැකි කරවන; සහ

(ii) සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයේ සිටින තැනැත්තන්ට,

අධිකරණය තුළ සිදු වන නඩු කටයුතුවලට සහභාගී වන වෙනත් සියලු තැනැත්තන් දැකීමට සහ ඔවුන්ට ඇහුම්කන් දීමට හැකි කරවන;

(ඇ) කැඳවීමට අපේක්ෂා කරනු ලබන සාක්ෂිකරුගෙන් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි විභාග කළ හැකි බවට සහ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි වාර්තාගත කරනු ලැබිය හැකි බවට; සහ

(ඈ) එකී විධානය කිරීම, නඩු කටයුත්තේ සෑම පාර්ශ්වයකට ම සාධාරණ වන බවට හෝ යුක්තිය පසිඳලීම සඳහා වන බවට,

සෑහීමකට පත් වන්නේ නම් මිස, (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකු කැඳවීම සඳහා වන ඉල්ලීම

**273ආ.** (1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකු කැඳවීම සඳහා යම් ඉල්ලීමක් සිදු කරනු ලබන අපරාධ නඩු කටයුත්තක සෑම පාර්ශ්වයක් විසින් ම, අනෙක් පාර්ශ්වයට දැන්වීමෙන් පසුව, දුරස්ථ ස්ථානයේ සිට සාක්ෂි ලබා දෙන සාක්ෂිකරුගේ අනන්‍යතාවය, සාක්ෂි ලබා දීම සඳහා භාවිත කරනු ලබන භාෂාව, සාක්ෂිකරු සිටින ස්ථානය සහ සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයට අදාළ විස්තර පිළිබඳ අධිකරණයට කරුණු ගොනු කිරීම හෝ කරුණු ගොනු කිරීමට සැලැස්වීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) සෑම සාක්ෂිකරුවකු විසින් ම, අනෙක් පාර්ශ්වයට පිටපතක් සහිතව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි ලබා දීමට පෙර,

තිරය හරහා දිවුරා සාක්ෂි ලබා දෙන තැනැත්තා තමා බවට දිවුරුම් ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සාක්ෂිකරු ළමයකු වන අවස්ථාවක දී සහ මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් එකී ළමා සාක්ෂිකරුගේ අනන්‍යතාව පිළිබඳ සෑහීමකට පත් වන අවස්ථාවක දී, එම විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, දිවුරුම් ප්‍රකාශයක් ගොනු කිරීමේ එකී අවශ්‍යතාව අත්හරිනු ලැබිය හැකි ය.

(3) රජයේ ආයතනයක සේවා නියුක්තව සිටින සාක්ෂිකරුවකු හැර ශ්‍රී ලංකාවේ වාසය කරන සාක්ෂිකරුවකු සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා කැඳවීමට යම් ඉල්ලීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඉල්ලීම සිදු කරනු ලබන පාර්ශ්වය විසින්, අධිකරණය විසින් කොමසාරිස්වරයා වශයෙන් සුදුසු තැනැත්තකු පත් කරනු නොලබන්නේ නම් 273ඇ වගන්තිය යටතේ කොමසාරිස්වරයා වශයෙන් පත් කළ යුතු තැනැත්තාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපින නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරනු ලබන සාක්ෂිකරුවකු සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා කැඳවීමට ඉල්ලීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඉල්ලීම සිදු කරනු ලබන පාර්ශ්වය විසින්, 273ඇ වගන්තිය යටතේ කොමසාරිස්වරයා වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු පත් කිරීමේ කාර්යය සඳහා, මහ කොමසාරිස් කාර්යාලයේ, තානාපති කාර්යාලයේ හෝ කොන්සල් කාර්යාලයේ ලිපිනය,

දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනයද ඇතුළුව එම මහ කොමසාරිස් කාර්යාලය, තානාපති කාර්යාලය හෝ කොන්සල් කාර්යාලය පිළිබඳ විස්තර අධිකරණයට ගොනු කරනු ලැබිය යුතු ය.

**සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සඳහා කොමසාරිස් වරයා සහ උසාවි නිලධරයා පත් කිරීම**

**273ඈ.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා-

(අ) (මෙහි මින් මතු මේ පනතේ ''කොමසාරිස්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) දුරස්ථ ස්ථානයේ සිටින කොමසාරිස්වරයකු; සහ

(ආ) (මෙහි මින් මතු මේ පනතේ ''උසාවි නිලධරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකරණය තුළ සිටින උසාවි නිලධරයකු,

පත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් පත් කරනු ලබන අධිකරණයේ යම් නිලධරයකු උසාවි නිලධරයා විය යුතු ය.

(3) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සාක්ෂිකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින හෝ වාසය කරන අවස්ථාවක දී, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, දුරස්ථ ස්ථානයේ සිටින කොමසාරිස්වරයා වශයෙන් නීතිඥවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) ශ්‍රී ලංකාවේ යම් රජයේ ආයතනයක සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් ඇති අවස්ථාවක දී සහ කැඳවීමට නියමිත සාක්ෂිකරු එකී

ආයතනයේ සේවානියුක්තයකු වන අවස්ථාවක දී, එකී ආයතනයේ ප්‍රධානියා හෝ එකී ආයතනයේ ප්‍රධානියා විසින් නම් කරන ලද එකී ආයතනයේ සේවා නියුක්තව සිටින යම් ජ්‍යෙෂ්ඨ විධායක නිලධරයකු හෝ නීතිඥවරයකු දූරස්ථ ස්ථානයේ සිටින කොමසාරිස්වරයා විය යුතු ය.

(5) යම් සාක්ෂිකරුවකුට රෝගී තත්ත්වයක් හෝ අශක්නුතාවක් හේතුවෙන් දූරස්ථ ස්ථානයට පැමිණීමට නොහැකි බවට දූරස්ථ ස්ථානය සඳහා පත් කරන ලද කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, එම කොමසාරිස්වරයා විසින්, අධිකරණය තුළ සිටින මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ලබාදෙනු ලබන යම් වැඩිදුර විධානයකට යටත්ව, සාක්ෂිකරු පදිංචිව සිටින නිවසට හෝ පදිංචිව සිටින වෙනත් යම් ස්ථානයකට ගොස්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා එකී සාක්ෂිකරුගේ සාක්ෂි විභාග කිරීම සම්බන්ධීකරණය කරනු ලැබිය හැකි ය.

අධිකාර භාර දීම

**273ඇ.** (1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සාක්ෂිකරුවකු කැඳවීමට විධානය කරනු ලබන මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, දූරස්ථ ස්ථානයේ සිටින කොමසාරිස්වරයා වෙත එකී විධානයේ පිටපතක් සමඟ වන අධිකාරයක්, ලියාපදිංචි තැපැල, කුරියර් සේවාව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා කැඳවීමට නියමිත සාක්ෂිකරු රජයේ ආයතනයක සේවානියුක්තයකු වන අවස්ථාවක දී, එකී අධිකාරය, ලියාපදිංචි තැපැල, කුරියර් සේවාව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ආයතනයේ ප්‍රධානියා වෙත භාර දිය යුතු ය.

(3) (අ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා කැඳවීමට නියමිත සාක්ෂිකරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරනු ලබන අවස්ථාවක දී, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, එම ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති ස්ථානයට අදාළ ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් කාර්යාලයේ, තානාපති කාර්යාලයේ හෝ කොන්සල් කාර්යාලයේ යම් රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකුට, මේ සංග්‍රහයේ දෙවන උපලේඛනයේ අංක 24 දරන ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව අධිකාරයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාරයක්, එකී රාජ්‍ය තාන්ත්‍රික නිලධරයා වෙත භාර දීම සඳහා ලියාපදිංචි තැපැල, කූරියර් සේවාව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පිටපත් දෙකකින් යුතුව විදේශ කටයුතු පිළිබඳ විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයාට භාර දිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සිටින කොමසාරිස් වරයා විසින් දිවුරුම් හෝ ප්‍රතිඥා ලබා දිය යුතු බව

**273ඉ.** කොමසාරිස්වරයකු ලෙස පත් කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම සහ සෑම උසාවි නිලධාරියකු විසින් ම, -

(අ) සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේ මේ සංග්‍රහයේ දෙවන උපලේඛනයේ අංක 25 දරන ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව දිවුරුමක් දී අත්සන් කිරීම හෝ ප්‍රතිඥාවක් දී අත්සන් කිරීම කරනු ලැබිය යුතු ය; සහ

(ආ) අධිකාරය සම්පූර්ණ කිරීමෙන් පසුව, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් විධානය කර ඇති පරිදි, එකී දිවුරුමේ හෝ ප්‍රතිඥාවේ පිටපතක් විද්‍යුත් තැපෑලෙන් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වහාම අධිකරණය වෙත එවිය යුතු අතර එහි මුල් පිටපත 273ජ වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති වාර්තාව සමඟ වහාම අධිකරණය වෙත ආපසු එවිය යුතුය.

දිනය, වේලාව ආදිය නියම කිරීම සහ ඒ පිළිබඳව සාක්ෂිකරුට දැනුම් දීම

**273ඊ.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි වාර්තාගත කිරීමට විධානය කරනු ලබන අවස්ථාවක දී, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, කොමසාරිස්වරයා, උසාවි නිලධරයා සහ පාර්ශ්ව විමසා, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කරනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි කැඳවනු ලබන යම් පාර්ශ්වයක් විසින්, සාක්ෂිකරුට සූදානම් වීමට සහ සාක්ෂි ලබාදීමට නියම කර ඇති ස්ථානයට ගමන් කිරීම සඳහා සාධාරණ කාලයක් ලබා දෙමින් (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද දිනය, කාලය සහ ස්ථානය පිළිබඳව ඔහුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

සිතාසි භාර දීම

**273උ.** (1) ශ්‍රී ලංකාවේ දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි කැඳවන ලෙස යම් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ එම මහෙස්ත්‍රාත්වරයා විසින්, V වන පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් විධානය කරනු ලබන ආකාරයට කුරියර් සේවාවක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්, සිතාසි භාර දීමට විධාන කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි ලබා දෙන යම් සාක්ෂිකරුවකු කැඳවීමේ සිතාසි, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලබන පරිදි කුරියර් සේවාවක් හෝ යම් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් භාර දෙනු ලැබිය හැකි ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි ලබා දීමට හෝ ලේඛන ඉදිරිපත් කිරීමට සහභාගී වීම අවශ්‍ය වන සාක්ෂිකරුවකුට නිකුත් කරන ලද සිතාසියක එම සාක්ෂි ලබාදීමට අදාළ දිනය, වේලාව සහ දුරස්ථ ස්ථානය පිළිබඳව සහ යම් ලේඛනයක් ඇත්නම් එය ද සමඟ ඉදිරිපත් වන ලෙස නිශ්චිතව දක්වා තිබිය යුතු අතර මේ පනතේ V වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූල විය යුතු ය.

මහාධිකරණයේ විනිශ්චයකාර වරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි කරුට සහාය වීම සඳහා අවශ්‍ය පත් කිරීම සහ වෙනත් නියෝග සිදු කරනු ලැබිය යුතු බව

**273ඌ.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, යම් පාර්ශ්වයක් විසින් කරන ලද යම් ඉල්ලීමක් මත හෝ ස්වකීය මෝසමක් මත, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරුවකුට සහාය වීම සඳහා පහත සඳහන් තැනැත්තන්ගෙන් යම් අයකු හෝ වැඩි ප්‍රමාණයක් පත් කරනු ලැබිය හැකි ය:-

(අ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු අධිකරණයේ භාෂාව පිළිබඳ

අවබෝධයක් නොමැති අවස්ථාවක දී, සුදුසුකම්ලත් භාෂා පරිවර්තකයකු;

(ආ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු ශ්‍රවණ හෝ කථන ආබාධයක් සහිත අවස්ථාවක දී, භාෂණ පරිවර්තකයකු;

(ඇ) සාක්ෂි විභාග කළ යුතු තැනැත්තා දෘශ්‍ය ආබාධයක් සහිත වන අවස්ථාවක දී, ලේඛන කියවීමේ විශේෂඥයකු; හෝ

(ඈ) සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු තාවකාලික හෝ ස්ථිර මානසික හෝ කායික දුබලතාවකින් පෙළෙන අවස්ථාවක දී, භාෂණ පරිවර්තකයකු හෝ භාෂා පරිවර්තකයකු හෝ විශේෂයෙන් පුහුණු කරන ලද අධ්‍යාපනඥයකු:

එසේ වුව ද, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, එකී භාෂා පරිවර්තකයා, විශේෂඥයා, භාෂණ පරිවර්තකයා හෝ අධ්‍යාපනඥයා එසේ භාෂා පරිවර්තකයකු, විශේෂඥයකු, භාෂණ පරිවර්තකයකු හෝ අධ්‍යාපනඥයකු වශයෙන් ස්වකීය කාර්ය ඉටු කිරීම සඳහා සුදුසුකම්ලත් අයකු බවට සෑහීමට පත් විය යුතු ය.

(2) දුරස්ථ ස්ථානයේ නිරීක්ෂකයකු ලෙස නීතිඥවරයකු වන තැනැත්තකු පත් කිරීමට මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් අනෙක් පාර්ශ්වයට ඉඩ ලබා දිය යුතු අතර ශ්‍රී ලංකාවෙන් පිටත සිටින සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එකී ස්ථානයේ නීතිඥවරයකු වශයෙන් හෝ දිවුරුම් කොමසාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි නිරතවීමට බලයලත් යම් තැනැත්තකු පත් කිරීමට ඉඩ ලබා දෙනු ලැබිය යුතු ය.

(3) ඉලෙක්ට්‍රොනික ලේඛන ඇතුළු ලේඛන භාවිත කළ යුතුව ඇත්නම්, නඩු විභාගයට පෙරාතුව හෝ නඩු විභාගය අතරතුර එකී ලේඛන විධිමත්ව හුවමාරු කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා උචිත මාධ්‍යයක් සඳහා පාර්ශ්ව විසින් එකඟ වී කටයුතු කරනු ලැබිය යුතු අතර, පාර්ශ්වයන්ට එසේ එකඟ වීමට නොහැකි නම්, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් හෝ මහෙස්ත්‍රාත්වරයා අවශ්‍ය නියෝග ලබා දීම සිදු කරනු ලැබිය හැකි ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමට සහභාගිවන තැනැත්තන්

**273එ.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලබන්නේ නම් මිස, අධිකරණය තුළ පවත්වනු ලබන නඩු විභාග කිරීම් යම් සජීවී නඩු විභාග කිරීමක් වශයෙන් ප්‍රසිද්ධියේ පවත්වනු ලැබිය යුතු අතර, අධිකරණය තුළ ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම සඳහා සහභාගී වීමට පාර්ශ්ව හෝ ඔවුන්ගේ නියෝජිතයන් සහ ඔවුන්ගේ නීතිඥවරු ඇතුළු සියලු තැනැත්තන්ට හිමිකම් ලැබිය යුතු ය.

(2) දුරස්ථ ස්ථානයේ දී සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම සඳහා සහභාගී වීමට පහත සඳහන් තැනැත්තන්ට හිමිකම් ලැබිය යුතු ය:-

(අ) කොමසාරිස්වරයා සහ අවශ්‍ය අවස්ථාවල දී තාක්ෂණික නිලධරයකු;

(ආ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා දීමට හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා පැමිණීම අවශ්‍ය වන සාක්ෂිකරුවකු;

(ඇ) භාෂා පරිවර්තකයකු, භාෂණ පරිවර්තකයකු හෝ විශේෂඥයකු හෝ සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීමේ දිනය සහ වේලාව

තීරණය කරනු ලබන අවස්ථාවේ දී විනිශ්චයකාරවරයා විසින් අවසර ලබා දෙන ලද වෙනත් යම් තැනැත්තකු; සහ

(ඈ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් අවසර ලබා දෙන ලද නිරීක්ෂකයකු.

කොමසාරිස් වරයාගේ හා උසාවි නිලධරයාගේ කාර්ය

**273ඡ.** (1) උසාවි නිලධරයා විසින්, මහාධිකරණයේ විනිශ්චයකාරවරයාගේ හෝ මහෙස්ත්‍රාත්වරයාගේ විධානය මත, සියලු පාර්ශ්ව විමසා, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා පැවැත්වීමට නියමිත නඩු විභාගයට ප්‍රමාණවත් තරම් පෙරාතුව, සාක්ෂිකරුගේ දුරස්ථ සාක්ෂි සඳහා අවශ්‍ය විය හැකි, පාර්ශ්ව විසින් එකඟ වී අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද අදාළ ලේඛනවල පිටපත් කොමසාරිස්වරයා වෙත ලද බව තහවුරු කරගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, සාක්ෂි විභාග කිරීම සඳහා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කර නීතියට අනුව ලේඛන ඉදිරිපත් කිරීම සඳහා වන බාධාවක් හෝ වාරණයක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා දුරස්ථ ස්ථානයක සිටින සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමේ දී, දුරස්ථ ස්ථානයේ සිටින සාක්ෂිකරු වෙත යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ නම්, අදාළ වන ලිඛිත නීතියට සහ කාර්යපටිපාටියට යටත්ව, පහත දැක්වෙන ආකාරයට ලේඛනය සාක්ෂිකරු වෙත ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙනු ලැබිය හැකි ය:-

(අ) ලේඛනය, අධිකරණයේ හෝ අධිකරණය රැස්වන වෙනත් ස්ථානයක ඇත්නම්, විද්‍යුත් තැපැල හරහා හෝ ලේඛන රූපකයක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික ආකාරයක් භාවිත කරමින් සාක්ෂිකරු වෙත ඉදිරිපත් කිරීම සඳහා ඒ ලේඛනයේ පිටපත් දුරස්ථ ස්ථානයේ සිටින කොමසාරිස්වරයා වෙත ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය;

(ආ) සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන දුරස්ථ ස්ථානයේ ලේඛනය ඇත්නම්, ඒ ලේඛනයේ පිටපතක් විද්‍යුත් තැපැල මගින් හෝ ලේඛන රූපකයක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික ආකාරයක් භාවිත කරමින් අධිකරණයට හෝ වෙනත් ස්ථානයට සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ලේඛනයේ දෘඪ පිටපත පසුව ලියාපදිංචි තැපැල හෝ කුරියර් සේවාව මගින් අධිකරණයට එවනු ලැබිය යුතු ය.

(4) සාක්ෂි විභාග කිරීම සඳහා සාක්ෂිකරුගේ පැමිණීම තහවුරු කරගැනීමට සහ ඒ හා සම්බන්ධ කාරණා තහවුරු කර ගැනීමට උසාවි නිලධරයා සමඟ සම්බන්ධීකරණය කොට අවශ්‍ය සියලු ප්‍රායෝගික විධිවිධාන සකස් කිරීමට සහ අධිකරණයේ සහාය සඳහා යම් අතිරේක ඉල්ලීමක් ඇත්නම් එය ඉටු කිරීම සඳහා කොමසාරිස්වරයා වගකියනු ලැබිය යුතු ය.

(5) සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම අතරතුර මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද සියලු

විධානයන් අනුගමනය කර ඇති බවට තහවුරු කිරීම සහ අධිකරණය විසින් සපයන ලද හෝ ඒ විනිශ්චයකාරවරයාගේ හෝ මහෙස්ත්‍රාත්වරයාගේ අනුමතය සහිත උපාංගයක් හැර වෙනත් යම් උපාංගයක් ඒ සාක්ෂි විභාග කිරීම අතරතුර භාවිත නොකළ බවට තහවුරු කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(6) යම් බලය නොලත් තැනැත්තකු විසින්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය ලෙස පටිගත කිරීම තහනම් විය යුතු ය. එකී සාක්ෂි විභාග කිරීමකට සහභාගී වීමට යම් පාර්ශ්වයකට හෝ නියෝජිතයකුට අවසර ලබා දී ඇති අවස්ථාවක දී, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, උචිත අවස්ථාවල දී, එවැනි පටිගත කිරීමක් සිදු නොකරන බවට ප්‍රතිඥාවක් කොමසාරිස්වරයා වෙත ලබා දෙන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි කරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම වාර්තාගත කිරීම අතරතුර ගත යුතු ආරක්ෂිත ක්‍රමවේද

**273ඹ.** (1) (අ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, කොමසාරිස්වරයාගේ සහාය ඇතිව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි විභාග කිරීමට නියමිත තැනැත්තාගේ අනන්‍යතාව තහවුරු කරගත යුතු අතර, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම සඳහා අධිකරණයේ නීතිය, පරිචය සහ කාර්යපටිපාටියට අනුකූලව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබා ගත යුතු ය.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු විසින්, මේ සංග්‍රහය යටතේ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි ලබා දෙමින් සිදු කරනු ලබන දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් සහ දිවුරුමක් සහ ප්‍රතිඥාවක් මගින් දෙන ලද ප්‍රකාශයක් මත ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ අධිකරණයක් තුළ දී හෝ වෙනත් ස්ථානයක දී සාක්ෂි ලබා දෙන්නේ නම් ඒ ආකාරයටම දෙන ලද බවට සැලකිය යුතු අතර ශ්‍රී ලංකාවේ තත්කාලයේ

බලපවත්නා යම් අදාළ ලිඛිත නීතියක් යටතේ, අධිකරණයට අපහාස කිරීමේ වරද සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්යය සඳහා, ඒ ආකාරයට ම සිදු කරන ලද බවට සලකනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විභාග කිරීම මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ලිඛිතව, විවෘත අධිකරණය තුළ දී හෝ ඔහු ඉදිරිපිට දී සහ ස්වකීය පෞද්ගලික මෙහෙයවීම සහ අධීක්ෂණය යටතේ නඩු විභාගයේ දී මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා සිටින ස්ථානයේ සිටින සාක්ෂිකරුවකුගෙන් සජීවීව සාක්ෂි විභාග කරන ආකාරයෙන් ම සිදු කළ යුතු අතර, එකී සාක්ෂි ලබා ගැනීම, විනිශ්චයකාරවරයා සිටින අධිකරණයේ දී පමණක් ඉලෙක්ට්‍රොනික ආකාරයට පටිගත කිරීම ද සිදු කරනු ලැබිය යුතු ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම අධිකරණයේ සාමාන්‍ය රාජකාරි වේලාව තුළ සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඇති විය හැකි අවස්ථානුගත කරුණු අනුව, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ශ්‍රව්‍ය දෘශ්‍ය සාක්ෂි විභාගයක වේලාවන් සම්බන්ධයෙන් උචිත විධානයන් සිදු කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ කාර්ය සඳහා, අධිකරණය හෝ දුරස්ථ ස්ථානය, විධිමත් අධිකරණයක් වශයෙන් පැවතිය යුතු අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමට අදාළ ක්‍රියාපිළිවෙළ නියම කරමින් 453 වන වගන්තිය යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

අධිකරණයේ සාමාන්‍ය පරිචයට අනුකූලව සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි - කරුවකුගේ සාක්ෂි විභාග කිරීම

**273ඕ.** (1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම, හැකි තාක් දුරට, විවෘත අධිකරණයේ සාමාන්‍ය අධිකරණ පරිචයට අනුව පවත්වනු ලැබිය යුතු අතර (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ සහ සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමට අදාළ විය යුතු විධිවිධාන සලස්වනු ලබන තත්කාලයේ බලපවත්වනා යම් ලිඛිත නීතියක විධිවිධාන, මේ සංග්‍රහයේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට, අදාළ විය යුතු ය.

(2) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් වීඩියෝ සබැඳි තාක්ෂණය මගින් නිර්මාණය කරන ලද වෙනස් වූ පරිසරය සහ සහභාගීවන්නන්ගේ භූගෝලීය විභේදනය සැලකිල්ලට ගෙන, පාර්ශ්වයන් විසින් ඉල්ලීමක් සිදු කළ ද, සිදු නොකළ ද, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම, සාධාරණ නඩු විභාගයක් සඳහා පාර්ශ්වයන්ට ඇති අයිතිවාසිකම කෙරෙහි බාධාකාරී නොවන බව සහතික කිරීම සඳහා උචිත විධාන සිදු කරනු ලැබිය හැකි ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් බිඳවැටීම

**273ක.** (1) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සිදු කරනු ලබන නඩු විභාගය අතරතුර තාක්ෂණික දෝෂයක් හේතුවෙන් එම සම්බන්ධකයේ යම් බිඳවැටීමක් ඇති වන අවස්ථාවක දී, උසාවි නිලධරයා සහ කොමසාරිස්වරයා විසින්, වහාම එම දෝෂය නිවැරදි කිරීමට සහ සම්බන්ධතාව යථා තත්ත්වයට පත් කිරීමට සියලු ප්‍රයත්නයන් දැරිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින්, දුරස්ථ ස්ථානයේ සිටින සාක්ෂිකරු එකී බිඳවැටීම අතරතුර අනෙක් සහභාගීවන්නන් සමඟ සන්නිවේදනය නොකරන බවට වගබලාගත යුතු අතර, එකී බිඳවැටීම අතරතුර,

හැකිතාක්, සාක්ෂිකරු අනෙක් සහභාගීවන්නන් සමඟ සන්නිවේදනය කිරීම වැළැක්වීමට සහ ඔවුන්ගේ සංචලතාව සීමා කිරීමට ඔහු විසින් සියලු පියවර ගත් බව, සම්බන්ධතාව යථා තත්ත්වයට පත් කිරීමෙන් පසු වහාම අධිකරණය තුළ සිටින මහාධිකරණයේ විනිශ්චයකාරවරයාට හෝ මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දිය යුතු ය.

(3) (අ) නඩු විභාගය අතරතුර යම් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක සම්බන්ධතාවය බිඳවැටේ නම් සහ යම් තාක්ෂණික දෝෂයක් වහාම නිවැරදි කළ නොහැකි නම්, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, නඩු විභාගය කල් තැබීම හෝ නඩු විභාගය තාවකාලිකව අත්හිටුවීම හෝ නැවත සැලසුම් කිරීම ඇතුළුව අවස්ථානුගත කරුණුවලට උචිත වෙනත් ආඥා සිදු කිරීම කරනු ලැබිය හැකි ය.

(ආ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා තමා විසින් ම හෝ කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත හෝ එකී දුරස්ථ නඩු විභාගයට ඉක්බිතිව ම යම් පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමක් මත, ඇති වූ තාක්ෂණික දෝෂය, සමකාලීන ශ්‍රව්‍ය-දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කර ඇති බවට සෑහීමකට පත් වන්නේ නම්, ඔහු විසින්, වහාම නඩු විභාගය අවලංගු කරනු ලැබිය හැකි අතර, නඩු විභාගය අලුතින් පැවැත්වීමට හෝ අධිකරණය තුළ භෞතිකව නඩු විභාගය පැවැත්විය යුතු බවට විධාන කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(4) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය බිඳවැටීම හේතුවෙන් නඩු කල් තැබීමක් සිදු වන අවස්ථාවක දී, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, සාධාරණ විය හැකි පරිදි වියදම් සම්බන්ධයෙන් වන ආඥාවක් සිදු කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා,-

"දුර්වල ශ්‍රව්‍ය දෘශ්‍ය ගුණාත්මකභාවය" යන්නෙන්, ලැබී ඇති පින්තූරය ඉතා අඩු ගුණාත්මක භාවයකින් යුතුවීම හෝ ඉතා දුර්වල ශබ්දයකින් යුතුවීම අදහස් වේ;

"තාක්ෂණික දෝෂය" යන්නට, මන්දගාමී සම්ප්‍රේෂණ වේගයට හෝ දුර්වල ශ්‍රව්‍ය දෘශ්‍ය ගුණාත්මකභාවයට හේතු වන යම් උපාංග හෝ ජාල බිඳවැටීමක් හෝ යම් වෙබ් අඩවියක හෝ සේවා සපයන්නාගේ දෝෂයක් ඇතුළත් වේ.

විනිශ්චය - කාරවරුන්ගේ බලතල සහ අධිකාරිය සහ කොමසාරිස්-වරයාගේ, උසාවි නිලධරයාගේ, නීතිඥවරයාගේ සහ සාක්ෂිකරුගේ වරප්‍රසාද ආදිය

**273ග.** (1) අධිකරණය තුළ අධිකරණ නඩු විභාගයක මූලාසනාරූඪ හෝ අධිකරණමය වශයෙන් ක්‍රියාකරන මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා සතුව ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකුගෙන් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ගනු ලබන සාක්ෂි සම්බන්ධයෙන් මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ මහේස්ත්‍රාත්වරයකු වශයෙන් තිබිය යුතු බලතල සහ අධිකාරිය ම තිබිය යුතු ය.

(2) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, අධිකාරය නිකුත් කරන ලද අධිකරණය සමඟ සම්බන්ධීකරණය කිරීමට සහ සම්බන්ධ වීමට

නිසි පරිදි නිකුත් කරන ලද අධිකාරයක් මත ක්‍රියා කරනු ලබන කොමසාරිස්වරයකු සහ උසාවි නිලධරයකු සතුව ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකුගෙන් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ගනු ලබන සාක්ෂි සම්බන්ධයෙන් අධිකරණයේ කොමසාරිස්වරයකු හෝ උසාවි නිලධරයකු වශයෙන් තිබිය යුතු වරප්‍රසාද, ආරක්ෂාව සහ මුක්තිය ම තිබිය යුතු ය.

(3) යම් නීතිඥවරයකු සතුව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් යම් පාර්ශ්වයක් වෙනුවෙන් පෙනී සිටීම සම්බන්ධයෙන්, එකී අධිකරණයේ හෝ අධිකරණය ඉදිරියේ යම් පාර්ශ්වයක් වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් නීතිඥවරයකු වශයෙන් තිබිය යුතු වරප්‍රසාද, ආරක්ෂාව සහ මුක්තිය ම තිබිය යුතු ය.

(4) දුරස්ථ ස්ථානයක සිට අධිකරණයේ නඩු විභාගයක සාක්ෂිකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව තුළ සිට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිට සහභාගී වන යම් තැනැත්තකු සතුව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂිකරුවකු වශයෙන් ලබා දෙන සාක්ෂි සම්බන්ධයෙන්, අධිකරණයේ හෝ අධිකරණය ඉදිරියේ වන නඩු විභාගයක සාක්ෂිකරුවකු වශයෙන් තිබිය යුතු ආරක්ෂාව ම තිබිය යුතු ය.

සාක්ෂි ලබා ගැනීම සඳහා හෝ ඉදිරිපත් කිරීම් සිදු කිරීම සඳහා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් භාවිත කිරීමට අදාළ වියදම්

**273ච.** (1) අනෙක් පාර්ශ්වය විසින් පත් කරනු ලබන යම් නිරීක්ෂකයකු සඳහා වන වියදම්, එකී අනෙක් පාර්ශ්වයේ නෛතික ගාස්තු සහ දුරස්ථ ස්ථානයට ලේඛන යැවීමේ වියදම් හැර, දුරස්ථ නඩු විභාගයක සියලු වියදම් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය අපේක්ෂා කරනු ලබන පාර්ශ්වය විසින් දැරිය යුතු ය:

එසේ වුව ද, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්ම හෝ මහේස්ත්‍රාත්වරයා විසින් ම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා ගැනීමට නියෝග කර ඇති අවස්ථාවක දී පාර්ශ්වයන් විසින් එකී වියදම් දැරීමට

එකඟ නොවන්නේ නම්, එකී ශ්‍රව්‍ය දෘශ්‍ය නඩු විභාගය සඳහා වන වියදම් අධිකරණය විසින් දරනු ලැබිය හැකි ය.

(2) යම් අධිකරණයක සජීවී තාක්ෂණික අධිකරණ ශාලාවක් ස්ථාපිත කර ඇති අවස්ථාවක දී හෝ යම් අධිකරණයකට ස්ථිරව ම වෙනත් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික සේවා සපයා ඇති අවස්ථාවක දී, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, අධිකරණ විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රීති හෝ චක්‍රලේඛවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම භාවිත කිරීම සඳහා වන වියදම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් අත්හරිනු ලැබිය හැකි ය.

(3) වියදම් ගෙවීමට අදාළව අධිකරණය විසින් කරනු ලැබිය හැකි ආඥාවල කුමක් සඳහන් වුව ද, ලේඛනයක් ඔප්පු කිරීම සඳහා සාක්ෂි මෙහෙයවීමෙන් පසුව, එම ලේඛනය අධිකරණය විසින් පිළිගනු ලබන අවස්ථාවක දී, ලේඛනය දෝෂාභියෝගයට ලක් කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්වය විසින්, අධිකරණය විසින් යම් සාධාරණ හේතුවක් මත අන්‍යාකාරයෙන් විධානය කරනු ලබන්නේ නම් මිස, බඳු වියදමට අමතරව, ලේඛනය ඔප්පු කිරීමේදී දරන ලද වියදම් ගෙවීමට යටත් විය යුතු ය.

අධිකාරය ආපසු යැවීම

**273ජ.** (1) අධිකාරය යථා පරිදි ක්‍රියාත්මක කිරීමෙන් පසුව, කොමසාරිස්වරයා විසින්, 273ආ වගන්තියේ සඳහන් දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත සමඟ මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද විධාන සහ අධිකාරිය නිකුත් කරන ලද අධිකරණයේ විධානවලට අනුකූල වීම සඳහා ඔහු විසින් ගන්නා ලද සියලු පියවර ඇතුළත් ස්වකීය නම යොදා අත්සන් කරන ලද ලිඛිත වාර්තාව සමඟ එය නිකුත් කරන ලද අධිකරණය වෙත ආපසු එවනු ලැබිය යුතු අතර, එකී වාර්තාව සහ දිවුරුම් ප්‍රකාශය නඩු වාර්තාවේ ගොනු කරනු ලැබිය යුතු ය.

(2) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කර ඉහත කී ආකාරයට වාර්තාගත කරන ලද සාක්ෂි, (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සහ දිවුරුම් ප්‍රකාශය අධිකරණයට ඉදිරිපත් කරන්නේ නම් මිස සහ එසේ ඉදිරිපත් කරනු ලබන තෙක්, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර නොගත යුතු ය:

එසේ වුව ද, දුරස්ථ ස්ථානය සඳහා කොමසාරිස්වරයකු පත් කිරීමකින් තොරව මෙහෙයවන ලද සාක්ෂි හැර, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් භාවිත කර ඉහත කී ආකාරයට වාර්තාගත කරන ලද සාක්ෂි, (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සහ දිවුරුම් ප්‍රකාශය අධිකරණයට ඉදිරිපත් කරන්නේ නම් මිස සහ ඉදිරිපත් කරනු ලබන තෙක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර නොගත යුතු ය.

දුරස්ථ සාක්ෂි විභාගයේ වාර්තාගත පිටපත සහ වීඩියෝ පටිගත කිරීමේ සහතික කරන ලද පිටපත් සඳහා වන ඉල්ලීම

**273**ට. (1) 273ඔ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂිකරුවකුගේ සාක්ෂි විභාග කිරීමේ දී වාර්තාගත කරන ලද සාක්ෂි, සාක්ෂි විභාගයේ නිල වාර්තාව විය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින්, දත්ත කේතගත කරන ලද මුල් පිටපත, නඩු වාර්තාවේ කොටස් වශයෙන් වෙන් වෙන්ව අධිකරණ ඩිජිටල් සේවාදායකයේ (court digital server) රඳවා තැබිය යුතු අතර, දත්ත කේතගත කරන ලද උපස්ථ පිටපත (encrypted backup copy) වෙනත් බාහිර යම් ආරක්ෂිත ස්ථානයක තැබිය යුතු ය.

(3) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තාගත කිරීම අතරතුර යම් වරප්‍රසාදිත සන්නිවේදනයක් සිදු වී ඇති බවට යම් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින්, ඒ සම්බන්ධයෙන් උචිත විධානයන් සිදු කරනු ලැබිය යුතු ය.

(4) යම් ඉල්ලීමක් මත, අධිකරණයේ තබා ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමේ මුල් පිටපත පරීක්ෂා

කර බැලීම සඳහා යම් පාර්ශ්වයකට අවසර දෙනු ලැබිය හැකි අතර, එකී ඉල්ලීම, රෙජිස්ට්‍රාර්වරයා හෝ තාක්ෂණ නිලධරයා ඉදිරියේ පමණක් මුල් පිටපත පරීක්ෂා කර බැලිය හැකි බව ඇතුළු දැඩි කොන්දේසිවලට යටත්ව, එක් එක් සිද්ධිය මත පදනම්ව මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් පමණක්ම තීරණය කරනු ලැබිය යුතු ය.

(5) අධිකරණය විසින්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීමේ මුල් පිටපතේ හෝ උපස්ථ පිටපතේ පිටපත් යම් පාර්ශ්වයක් වෙත නිකුත් කරනු නොලැබිය යුතු ය.

**අධිකරණයේ කොටස් වශයෙන් සලකනු ලැබිය යුතු ස්ථාන හෝ පරිශ්‍ර**

**273ඩ.** (1) මේ සංග්‍රහය යටතේ යම් නඩු විභාගයක සාක්ෂි ලබා දීමේ කාර්යය සඳහා සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කරනු ලබන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක්, මේ සංග්‍රහය යටතේ නඩු විභාග පැවැත්වීමේ කාර්යය සඳහා අධිකරණ ශාලාවක හෝ වෙනත් ස්ථානයක අධිකරණ කටයුතු පවත්වනු ලබන, ශ්‍රී ලංකාවේ අධිකරණයේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) දුරස්ථ ස්ථානයේ දී සිදු කරන ලද යම් වරදක්, ශ්‍රී ලංකාවේ දැනට බලාත්මකව පවතින නීතිවල කාර්ය සඳහා, අධිකරණ ශාලාව තුළ හෝ අධිකරණ කටයුතු පැවැත්වෙන වෙනත් ස්ථානයක සිදු කරන ලද වරදක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, සාක්ෂි, කාර්යපටිපාටි, අධිකරණයට අපහාස කිරීම හෝ බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් අදාළ වන නීති අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කර ගනු ලැබිය යුතු ය.

(3) ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා අධිකරණයක් විසින් පවත්වනු ලබන සියලු නඩු විභාග අධිකරණ කටයුතු විය යුතු අතර, සාදනු ලබන නියෝගවල ක්‍රියාපිළිවෙළ ඇතුළුව යම් භෞතික අධිකරණයකට අදාළ විය හැකි සියලු ආචාරධර්ම

සහ පරිචයන් මේ නඩු විභාග සඳහා අදාළ කර ගත යුතු ය.

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා විශේෂඥ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාග කිරීම

**273ණ.** (1) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, මෙහි මින් මතු මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට විශේෂඥ සාක්ෂිකරුවකුගෙන් වාර්තාවක් හෝ සාක්ෂි කැඳවනු ලැබිය යුතු ය.

(2) (අ) 148 වන සහ 397 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, මහෙස්ත්‍රාත්වරයා විසින්, උචිත අවස්ථාවල දී, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීමට හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීමට යම් විශේෂඥ සාක්ෂිකරුවකු කැඳවනු ලැබිය හැකි ය.

(ආ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, උචිත අවස්ථාවල දී, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා සාක්ෂි ලබා දීමට හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීමට යම් විශේෂඥ සාක්ෂිකරුවකු කැඳවනු ලැබිය හැකි ය.

(3) අවස්ථාවෝචිත පරිදි, මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, V වන පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි හෝ කුරියර් සේවාවක් හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් යම් විශේෂඥ සාක්ෂිකරුවකු කැඳවනු ලැබිය හැකි ය.

(4) යම් කැඳවීමේ සිතාසියක් ලැබීම පිළිගැනීම සහ එකී සිතාසිය මගින් නිකුත් කර ඇති ආඥාව සමඟ අනුකූල වීම එකී කැඳවීම ලද එකී විශේෂඥ සාක්ෂිකරුගේ කාර්යය විය යුතු ය.

(5) මහාධිකරණයේ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට විශේෂඥ සාක්ෂිකරුට නියෝග කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර ඉලෙක්ට්‍රොනික අත්සනක් මගින් එකී වාර්තාව සහතික කරනු ලැබිය යුතු ය.

(6) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාවක අඩංගු කරුණු, එකී විශේෂඥ සාක්ෂිකරුගේ පෞද්ගලික පෙනී සිටීම, නඩුවේ පාර්ශ්වයන් විසින් අවධාරණය කරනු නොලබන්නේ නම් සහ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් එය උචිත බවට සලකනු ලබන්නේ නම්, එකී කරුණු සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගත යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යය සඳහා, "විශේෂඥ සාක්ෂිකරු" යන්නට, අධිකරණ වෛද්‍ය නිලධරයකු, වෝහාරික වෛද්‍ය නිලධරයකු, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධරයකු සහ විශ්වවිද්‍යාලයක වෛද්‍ය පීඨයක වෝහාරික වෛද්‍ය අධ්‍යයනාංශයේ වෝහාරික වෛද්‍ය විශේෂඥයකු ඇතුළත් වේ.

නියෝග

**273ත.** 273අ වන වගන්තියේ සිට 273ණ වන වගන්තිය දක්වා (එම වගන්ති දෙකද ඇතුළුව) වන වගන්තිවල කාර්ය සඳහා, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟතාව සහිතව නියෝග සාදනු ලැබිය යුතු ය:-

(අ) සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය භාවිත කිරීම මගින් යම් තැනැත්තකු පෙනී සිටිය යුතු අවස්ථාවක දී, භාවිත කළ යුතු උපාංග වර්ගය සහ තාක්ෂණ ක්‍රමය සහ සලස්වනු ලැබිය යුතු විධිවිධාන නියම කිරීම;

(ආ) යම් අධිකරණයක්, නම් කළ සජීවී තාක්ෂණ අධිකරණ ශාලාවක් වශයෙන් ප්‍රකාශ කිරීම;

(ඇ) නඩු විභාග සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක සැපයීම වෙනුවෙන් යම් බාහිර සේවා සැපයුම්කරුවකුට ගෙවිය යුතු සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක වියදම් සහ ගෙවීම් ඇත්නම්, ඒවා නියම කිරීම; සහ

(ඈ) මේ සංග්‍රහය පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය වන හෝ එහි සම්පූර්ණ බලාත්මකභාවය සඳහා අවශ්‍ය වන, මේ සංග්‍රහය මගින් අරමුණු කරනු ලබන වෙනත් යම් කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම.

අර්ථ නිරූපණය

**273ද.** 273අ වන වගන්තියේ සිට 273ත වන වගන්තිය දක්වා (එම වගන්ති දෙක ද ඇතුළුව) වන වගන්තිවල කාර්යය සඳහා -

"සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය" යන්නෙන් -

(අ) සාක්ෂි ලබා දෙනු ලබන දුරස්ථ ස්ථානයක සිට හෝ වෙනත් යම් ස්ථානයක සිට නඩු කටයුතු සඳහා සහභාගී වන වෙනත් සියලුම තැනැත්තන් දැකීම සහ ඇසීම සඳහා අධිකරණ ස්ථානයේ සිට නඩු කටයුතුවලට සහභාගී වන තැනැත්තන් සම්බන්ධ කරනු ලබන; සහ

(ආ) අධිකරණ ස්ථානයේ සිට හෝ වෙනත් ස්ථානයක සිට නඩු

කටයුතුවලට සහභාගී වන තැනැත්තන් දැකීම සහ ඇසීම සඳහා දුරස්ථ ස්ථානයක සිට නඩු කටයුතුවලට සහභාගී වන වෙනත් සියලු ම තැනැත්තන් සම්බන්ධ කරනු ලබන,

යම් තාක්ෂණික පහසුකමක් අදහස් වේ;

"අධිකරණය" යන්නට, භෞතිකව රැස් වී සාම්ප්‍රදායික ආකාරයෙන් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අසනු ලබන අධිකරණ ශාලාව හෝ වෙනත් ස්ථානයක් ද ඇතුළත් වේ;

"ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන්නෙන්, තොරතුරක් හෝ ලේඛනයක් ඉලෙක්ට්‍රොනික, චුම්බක, ප්‍රකාශ (optical) හෝ මාධ්‍යය කුමක් වුව ද, වෙනත් යම් සමාන ආකාරයකින් උත්පාදනය කරන, යවනු ලබන, ලබා ගනු ලබන හෝ ගබඩා කරනු ලබන යම් ක්‍රමවේදයක් අදහස් වේ;

"විශේෂඥ වාර්තාව" යන්නට, විශේෂඥයකුගේ අදහස් සහ එකී අදහස සකස් කිරීමට පදනම් වූ කරුණු දක්වනු ලබන සහ ප්‍රකාශය භාර දෙනු ලබන පාර්ශ්වය විසින් නඩු ඇසීමේ දී මුලින් ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන සාක්ෂිය වන විශේෂඥයාගේ අදහසේ හරය අන්තර්ගත විශේෂඥයකු විසින් ලිඛිතව ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයක් ද ඇතුළත් වේ;

"රාජ්‍ය ආයතනය" යන්නට -

(අ) රජය වෙනුවෙන් විධායක හෝ පරිපාලන කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන

යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභා අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය මණ්ඩලයක්; හෝ

(ආ) යම් පළාත් පාලන ආයතනයක් හෝ කාර්යාලයක්, මණ්ඩලයක් හෝ නියෝජිතායතනයක් හෝ අස්ථිත්වයක් හෝ නියෝග මගින් නියම කරන ලද වෙනත් යම් රජයේ නියෝජිතායතනයක් හෝ අස්ථිත්වයක්; හෝ

(ඇ) රජය හෝ පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක් විසින් හිමිකම් දරන හෝ පාලනය කරනු ලබන යම් රෝහලක්, සෞඛ්‍ය සේවාවක්, සායනයක්, රැඳවුම් හෝ විශෝධන සේවා මධ්‍යස්ථානයක්, ළමා නිවාසයක් හෝ රැකවරණ නිවාසයක්, ළමා සුරැකුම් මධ්‍යස්ථානයක්, තරුණ වරදකරුවන් පුහුණු පාසලක්, භාරකාර නිවසක්, ආබාධිත මධ්‍යස්ථානයක් සහ පරිවාස සහ ළමාරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ වන යම් මධ්‍යස්ථානයක් සහ ළමයින් සහ තරුණ තැනැත්තන් සහ තරුණ වරදකරුවන්ගේ ආරක්ෂාව සඳහා වන යම් මධ්‍යස්ථානයක්,

ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ අධිකරණ විෂයය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

" රඳවා තබා ඇති ස්ථානයක් භාර නිලධරයා" යන්නෙන්, අදාළ රැඳවුම් ස්ථානයේ පරිපාලනය සහ පාලනය භාරව සිටින අධිකාරිවරයා, කළමනාකාරවරයා හෝ වෙනත් නිලධරයා අදහස් වේ;

"රඳවා තබා ඇති ස්ථානය" යන්නෙන්, යම් ලිඛිත නීතියක අර්ථානුකූලව යම් රැඳවුම් මධ්‍යස්ථානයක් අදහස් වන අතර, ඊට පුහුණු පාසලක්, රිමාන්ඩ් නිවාසයක්, සැකකරුවන් සහ චූදිතයන් සඳහා වන අවසරලත් පාසලක් සහ (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ අර්ථානුකූලව නිරෝධායන මධ්‍යස්ථානයක් සහ 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ අර්ථානුකූලව ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් අදහස් වේ;

" පටිගත කිරීම " යන්නෙන් -

(අ) තනි රූපයක්, චංචල රූපයක් හෝ යම් ශබ්දයක්; හෝ

(ආ) තනි රූපයක්, චංචල රූපයක් හෝ නිපදවිය හැකි හෝ ප්‍රතිනිපදවිය හැකි යම් ශබ්දයක්,

යම් මාධ්‍යයකින් පටිගත කිරීම අදහස් වේ;

“දූරස්ථ ස්ථානය” යන්නෙන්, අධිකරණය තුළ නඩුව විභාග කරනු ලබන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නිකුත් කරන ලද අධිකාරයක් මත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා සාක්ෂි විභාග කළ යුතු සාක්ෂිකරු සිටින ස්ථානය හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා නඩු කටයුතු සඳහා වන වෙනත් යම් දූරස්ථ ස්ථානයක් අදහස් වේ;

“සජීවී තාක්ෂණ අධිකරණ ශාලාව” යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා, මහජනතාව සහ අධිකරණය භාවිත කරන්නන් සඳහා, වෙනත් අධිකරණ පරිශ්‍රවල පවත්වනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි වෙනත් යම් ස්ථානයක් සමඟ සම්බන්ධ වී විකාශය කරනු ලබන නඩු විභාග බැලීම සහ ඇසීම සඳහා හැකි කරවන පරිශ්‍ර ලෙස අමාත්‍යවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයා විමසා දෙන ලද විධානයන්ට අනුකූලව 273ත වන වගන්තිය යටතේ සාදන ලද නියෝග

ප්‍රකාරව ප්‍රකාශයට පත්කරන ලද අධිකරණ ශාලා අදහස් වේ;

“සම්ප්‍රේෂණය” යන්නෙන්, තනි රූපයක්, චංචල රූපයක් හෝ යම් ශබ්දයක් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් යැවීම අදහස් වේ;

“රජයේ ආයතනයක සේවයේ නියුක්ත සාක්ෂිකරු යන්නෙන් -

(අ) රජයේ ආයතනයක කාර්ය මණ්ඩල සාමාජිකයකු හෝ නඩු විභාගවල දී හෝ යෝජිත නඩු විභාගවල දී සාක්ෂි වශයෙන් භාවිත කිරීම සඳහා විශේෂඥ වාර්තාවක් සපයන යම් රජයේ ආයතනයක සේවයේ නියුක්ත හෝ එකී ආයතනය විසින් සේවයේ නිරත කරවා ඇති හෝ නඩු විභාගවල දී නිගමන සාක්ෂි ලබා දීමට විශේෂඥයකු වශයෙන් කැඳවා ඇති යම් තැනැත්තකු;

(ආ) යම් රජයේ ආයතනයක් භාරයේ තබා ඇති එකී රජයේ ආයතනයේ ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ ලේඛනයක් සනාථ කිරීමට කැඳවනු ලබන එකී රජයේ ආයතනයේ සාමාජිකයකු; හෝ

(ඇ) රජයේ ආයතනයක යම් සේවානියුක්තයකු හෝ යම් රජයේ ආයතනයක යම්

නියෝග හෝ විධාන මගින් නියම කර ඇති කුලකයක වෙනත් යම් සාක්ෂිකරුවකු,

අදහස් වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය, එහි 23 වන ආකෘතියට ඉක්බිතිව ම, පහත දැක්වෙන ආකෘති ඇතුළත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලබන අතර, ඒවා එම උපලේඛනයේ 24 වන ආකෘතිය සහ 25 වන ආකෘතිය වශයෙන් බලාත්මක විය යුතු ය:-

"අංක 24

අධිකාරයේ ආකෘති පත්‍රය

[273ඇ(3)(අ) වගන්තිය]

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ/ මහ කොමසාරිස් කාර්යාලයේ/ කොන්සල් කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු වෙත විදේශයන්හි දී අධිකාරයක් කිරීම සඳහා වන ඉල්ලීම**

වෙත: ලේකම්<br>
විදේශ කටයුතු අමාත්‍යාංශය<br>
කොළඹ 01

| | |
|---|---|
| අධිකාරය නිකුත් කරන ලද අධිකරණය: | |
| නඩු අංකය: | |
| නඩුවේ පාර්ශ්ව: | |
| නඩුවේ ස්වභාවය:<br>ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය: | භාර ගැනීමේ බලධරයාගේ නම සහ ලිපිනය: |
| ඉල්ලීම -<br>රාජ්‍යතාන්ත්‍රික නිලධරයා වෙත භාර දීමට නියමිත වන අධිකාරය:<br>රට:<br>ස්ථානය:<br>ලිපිනය: | |

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 273 ..................... සහ 273 ............................ වගන්ති ප්‍රකාර වේ.

අමුණා ඇති ලේඛන : .........................

දිනය : .............................

........................................<br>
රෙජිස්ට්‍රාර්වරයාගේ<br>
අත්සන හා නිල මුද්‍රාව

අමුණා ඇති අධිකාරය ලේඛන සමඟ, තානාපති කාර්යාලයේ / මහ කොමසාරිස් කාර්යාලයේ / කොන්සල් කාර්යාලයේ නිසි පරිදි පත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික නිලධරයා වෙත භාර දීම සහ මේ ආකෘති පත්‍රයේ පිටපතක්, මෙහි පිටසන් කරන ලද සහ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද භාර දීමේ ප්‍රකාශය සමඟ ............................ අධිකරණය වෙත වාර්තා කිරීම, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

පිටසන :

දිනය : ............................ අත්සන ..........................

අංක 25

[273 ඉ (අ) වගන්තිය]

**කොමසාරිස්වරයා හෝ උසාවි නිලධරයා විසින් දෙනු ලබන දිවුරුම හෝ ප්‍රතිඥාව**

................................................ වන මම, කොමසාරිස්වරයකු හෝ උසාවි නිලධරයකු වශයෙන් වන මාගේ ධුරයේ කාර්ය, භයක් හෝ පක්ෂපාතීත්වයකින්, ළබැඳියාවක් හෝ වෛරයකින් තොරව ............................................................ මහාධිකරණයේ විනිශ්චයකාරවරයා / මහෙස්ත්‍රාත්වරයා විසින් ලබා දෙන ලද නීතිය සහ විධානයන්ට අනුකූලව නිසි පරිදි සහ පක්ෂපාතීව සහ මාගේ දැනුම සහ ශක්ති ප්‍රමාණයෙන් ඉටු කරනු ලැබ ඇති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.”.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.